**නාරම්මල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව2020 ජුනි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.953,900 ක් වූඉඩම්, නාගොල්ල වත්ත - මැදගොඩ පිහිටි ඉඩම සහ ගොඩනැගිලි 07 ක වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම සකස් කිරීමේදී ඊට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | වටිනාකමරු.5,500,000 ක් වූ ඉඩම් 03 ක් රු.550,000 ක් ලෙස දක්වා තිබීමෙන් ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම රු.4,950,000 ක් අඩුවෙන් අවසන් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන්ට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,301,357 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වටිනාකම රු.8,677,904 ක් වූ ගිණුම් විෂයයක් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂවලට අදාල ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

-----------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති201 | 1,150,532 | පොදු තරඟකාරීත්වයකින් තොරව තෝරාගත් එක් ආයතනයකින් මිළදී ගැනීම් සිදුකර තිබුණි. | නීති, රීති, රෙගුලාසිවලට අනුකූල වන පරිදි සහා අරමුදලට වාසිදායක වන ආකාරයට ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුවේ. | මින් ඉදිරියට පොදු තරඟකාරී මිල ගණන් යටතේ මිලදී ගැනීම් සිදු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | වෙනත් චක්‍රලේඛ<br>---------------------- | | | | |
| | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 දරන චක්‍රලේඛය | | වසර 05 කට වරක් හෝ බදු කුලී තක්සේරුවකින් තොරව දඹදෙණිය උපකාර්යාලයට අයත් කඩ කාමර 11 ක් දීර්ඝ කාලයක් තිස්සේ බදුදීමට කටයුතු කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දඹදෙණිය උප කාර්යාලයට අයත් කඩ කාමර පසු ගිය වර්ෂයේදී අලුත්වැඩියා කරන ලද අතර නව තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.18,948,783 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේපුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.25,146,518 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 | ඇස්තමේන්තුගතආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 |
| I. | වරිපනම් හා බදු | 12,056 | 13,023 | 12,123 | 3,016 | 8,443 | 12,536 | 12,022 | 2,402 |
| II. | කුලී | 25,405 | 26,216 | 24,574 | 194 | 25,430 | 24,227 | 24,166 | 145 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,328 | 822 | 822 | - | 1,311 | 1,013 | 1,013 | - |
| IV. | වෙනත් ආදායම් | 85,095 | 87,999 | 89,690 | 41,006 | 75,841 | 80,785 | 116,734 | 32,465 |
| එකතුව | | 123,884 | 128,059 | 127,209 | 44,216 | 111,025 | 118,561 | 153,935 | 35,012 |

**2.2.2 වරිපනම් හා බදු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති රු.3,015,711ක මුදලෙන් 2020 අප්‍රේල් 30 දිනට තවදුරටත් රු.2,419,387 ක මුදලක් අයවීමට පැවතුණි. | වර්ෂයට අදාළ ආදායම්, පනතේ හා රීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ මුදල අයකර ගැනීමටද කටයුතු කළ යුතුවේ. | ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**2.2.3 කුලී**

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩ කාමර බදු ලබාදීම සම්බන්ධයෙන් අත්සන් තබන ලද ගිවිසුම්අනුව බදුකරු විසින් භුක්තිය අන්‍යයකුට විකිණීම, පැවරීම හෝ අතුරු බදුදීමනොකළ යුතු වුවත් නාරම්මල පොදු වෙළද සංකීර්ණයේ කඩ කාමර 02 ක් හා නාරම්මල නව වෙළද සංකීර්ණයේ කඩ කාමර 05 ක් අතුරු බදු දී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව හා කඩ කාමර බදුදීමට අදාළ පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බදු අයිතිකරුවන් විසින් අතුරු බදු දී ඇද්දැයි පරීක්ෂා කර බලා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.3,353,470 ක් හා මුද්දර ගාස්තු රු.29,829,010 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | උසාවි දඩ මුදලින් රු.2,437,706 ක මුදලක් සහ මුද්දර ගාස්තුවලින් රු.12,885,716 ක මුදලක් ලැබී ඇති බව දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

**අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කිවුල්ගල්ලේ දුම්මලේවත්ත ජල ව්‍යාපෘතිය සඳහා ජල මෝටරයක් සපයා සවිකර වසර 02 ක් ගතවී තිබුණද, ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාගැනීමට නොහැකිව පැවතුණි. ජල පොම්පාගාරයේ සිට ජල ගබඩා ටැංකියට ජලය සපයා ගැනීමට හැකිව තිබුණද, ජලය බෙදා හැරීමේ නළ කැඩී තිබීම හා අවහිරව තිබීම ඊට හේතුවී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුවේ. | 2020 ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ජලනල එළීම (මීටර් 274 ක දුරක්) සඳහා ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා යොමු කර ඇති අතර අනුමැතිය ලැබුන විගස එය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 54,322,570 ක ලැබිය යුතු ගිණුම් ශේෂයෙන් වර්ෂයක කාලය ඉක්මවා තිබූ ශේෂය රු.1,507,707 ක් විය. | තවදුරටත් ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂයක කාලයක් ඉක්මවූ රු.1,507,707 ක ලැබිය යුතු ගිණුම් ශේෂයෙන් මේ වන විට රු.1,377,997 ක මුදලක් අයකරගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ ශේෂය රු.8,329,138 ක් විය. | තවදුරටත් නිරවුල් කළ යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ රු.31,112,339 ක මුදලින් මේ වන විට රු.10,076,016.78 ක මුදලක් අයකරගෙන ඇති අතර වර්ෂයක කාලයක් ඉක්මවූ රු.8,329,138 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවලින් මේ වන විට රු.2,687,460 ක මුදලක් ගෙවීමට කටයුතු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්ත

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ද්විතියික අංශයේ තනතුරු 04 ක පුරප්පාඩු පැවැති අතර, ප්‍රාථමික අංශයේ පුරප්පාඩු 08 ක්ද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ ස්ථිර කරන ලද නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු සේවකයින් 12 ක් අතිරික්තවද පැවතුණි. අනියම්/කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් සහ සේවකයින් 15 ක්ද අනුමත කාර්යය මණ්ඩල ඉක්මවා බඳවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවක පුරප්පාඩු හා අතිරික්ත යටතේ සඳහන් කර ඇති සාරාංශ තොරතුරු නිවැරදි බව දන්වා සිටිමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ බඳවාගත් සේවකයින් 05 දෙනෙකු තනතුරුවලට, අදාළ රාජකාරිවලට අනුයුක්ත නොකර කාර්යාල කටයුතුවල යොදවාගෙන තිබුණි. | එක් එක් තනතුරුවලට අදාළ රාජකාරි පවරා මහජන සේවාව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුවේ. | රා. ප.ච. ලේ 20/2014 යටතේ බඳවාගන්නා ලද මෙම සේවක මහත්මීන් රාජකාරීවල යොදවා ඇත්තේ ආයතනයේ සේවා අවශ්‍යතාවය සහ නිලධාරී පුරප්පාඩු පැවතීම හේතුවෙනි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දැලිකණුඅංග මාතෘ සායන මධ්‍යස්ථානය පවත්වා ගෙන යන ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා නොගත් වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දැලිකණුඅංග මාතෘ සායන මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩම සභාව නමට පවරා ගැනීමේ කටයුතු සඳහා අදාල ආයතන සමඟ කටයුතු කරමින් පවතින බව සඳහන් කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**-------------**

**3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළ වැඩ වටිනාකම රු.321,042 ක් වූ නාරම්මල සිසිර මාවත තාර දමා ප්‍රතිසංස්කරණය කළ මාර්ගයේ මීටර් 3x.15, 1x.3, 4.3x.3, 3 (1+.5)ප්‍රමාණවල ස්ථාන 08 ක වර්ග මීටර් 4.38 ක පමණ ප්‍රමාණයක් ගල් ගැලවී වලවල් සෑදී තිබුණි. | කර්මාන්ත පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු අතර පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පලුදුවීම සිදුවී ඇති ස්ථාන විධිමත්ව සකස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | කළ වැඩ වටිනාකම රු. 688,987 ක් වූ පොල්ගස්යාය මාර්ගය භෞතිකව පරීක්ෂා කරන අවස්ථාව වන විට මාර්ගයේ දෙපස හා මැද ස්ථාන 15 ක පමණ වර්ග මීටර් 16.26 ක ප්‍රමාණයකට හානි සිදුවී ගල් ඉවත්වෙමින් පැවතුණි. අදාළ කර්මන්තයේ ඇස්තමේන්තුව, ප්‍රමාණ පත්‍රය, කළ වැඩ වටිනාකම ද්‍රව්‍ය භාවිතය, සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පවතින අඩුපාඩු සම්පූර්ණ කර කර්මාන්ත ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුවේ. | මෙම මාර්ගය ස්ථාන 15 ක පමණ සිදු වී ඇති පලුදුවීම් නිසි පරිදි සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | කළ වැඩ වටිනාකම රු. 2,501,169 ක් වූ නාරම්මල මයුරපාද පාසල හා පන්සල් මාවත ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේපන්සල මාර්ගයේ මීටර් 6.3 (.8 + .3 / 2) ප්‍රමාණයක් මාර්ගයට හානි වී ගල් ගැලවී ඉවත්ව තිබුණි. මීටර් 6X.3 පමණ ප්‍රමාණයක ඉවුරු ප්‍රදේශය කැඩී ගල් ඉවත්ව තිබුණි. මෙම මාර්ග දෙක සඳහා පළමුවර හා දෙවනවර තාර ආලේපය වෙනුවෙන් තාර ලීටර් 5,397.4 ක් සඳහා රු. 757,540 ක් වැය කර තිබුණද, නිසි පරිදි මාර්ගය පුරා තාර ආලේපය සිදුකර නොතිබුණි. | කර්මාන්ත පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු අතර පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කැඩී ගොස් ඇති කොටස් විධිමත්ව නැවත සකස් කරන බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම පන්සල් මාර්ගයේ දෙවන වර තාර ආලේපයේදී තාර විසිරී යාම වලක්වා නැවත නිසි පරිදි සකස් කරවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සිරිගල පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේවැඩ විෂයය අංක 01, 05 හා 08 යටතේඅවස්ථා 3 කදීරු. 627,148 ක් වටිනා තාර ලීටර් 4,076.40 ක් යොදා ඇති බවට සඳහන් කළද, මාර්ගයේ මතුපිට තාර ආලේපය නිසි පරිදි සිදුව නොතිබුණි. | කර්මාන්ත පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු අතර අදාළ වාර්තා පවත්වාගෙන යා යුතුවේ. | මූලික ආලේපනය සමහර ස්ථානවල කොන්ක්‍රීට් එකට තදින් අල්ලා නොගැනීම හේතුවෙන් (මඩ හෝ දූවිලි හොඳින් ඉවත් නොවීම නිසා) ඇතැම් ස්ථානවල නිසි පරිදි තාර විසිරී යාම සිදු වී නැත. එම ස්ථාන නැවත සකස් කරවීමට කටයුතු කරමි. |
| (ඉ) | මොරගොල්ල ප්‍රජාශාලාව වටා දැල් ගැසීමේ කර්මාන්තය සඳහා රු.235,746 ක් ගෙවා තිබූ නමුත් ඇස්තමේන්තුවට අනුකූල නොවන පරිදි ප්‍රධාන පිටත රාමුවට මි.මී.37 × 31 ×3 කොන් යකඩ යෙදීම , මි.මී. 600 පරතරය වෙනුවට මි.මී. 700, 800 පරතරයට පැතලි යකඩ සවිකිරීම, දැලේ මැදට මි.මී. 100 පරතරයට මි.මී. 20 × 5 පැතලි යකඩ බාර් දෙකක් නොයෙදීම, සවිකර තිබූ දැලේ මි.මී. 75 පරතරය වෙනුවට මි.මී. 80, මි.මී. 90 පරතරය පැවති අතර මල නිවාරණ තීන්ත ආලේප කර නොතිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව අදාළ කර්මාන්ත සිදුකිරීම පිළිබඳව අධීක්ෂණය කළ යුතුවේ. | කර්මාන්තයේ අඩුපාඩු පිළිගන්නා අතර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | දඹදෙණිය ශාන්ත බණ්ඩාර ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරුව සකස් කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 04 යටතේ 1:2:4 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කර්බ් යෙදීමට ඝන මීටර් 16.80 ක් සඳහා රු. 15,817 බැගින් රු.265,726 ක් ගෙවා තිබුණි. ස්ථාන 06 ක් භෞතික පරීක්ෂාවේදී ස්ථාන 04 කම නියමිත උස වන මි.මී. 225 නොතිබුණු අතර ස්ථාන රාශියක පළල 100 හා112 වශයෙන් පැවතුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව අදාළ කර්මාන්ත සිදු කිරීම පිළිබඳව අධීක්ෂණය කළ යුතුවේ. | ඒවා නියමිත ප්‍රමාණයට සැකසීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |